# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

## මාළිගාවත්ත, කොළඹ -10

## වැය ශීර්ෂ අංකය : 290 – 01 – 01 – 0 - 1490


| අන්තර්ගතය | පිටු අංක |
|---|---|
| **01.** ආයතනික පැතිකඩ | 2 - 4 |
| **02.** ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 5 - 9 |
| **03. 2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 10 - 17 |
| **04.** කාර්ය සාධන දර්ශක | 18 - 21 |
| **05.** තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්ය සාධනය | 22 - 23 |
| **06.** මානව සම්පත් පැතිකඩ | 24 - 26 |
| **07.** අනුකූලතා වාර්තාව | 27 - 32 |

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත සහ 1979 අංක 59 දරණ ධීවර (විදේශ ධීවර යාත්‍රා) පනත හා ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම සහ වර්තමාන ප්‍රවණතා සහ ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව කළ යුතු සංශෝධන හා නව නියෝග හඳුන්වා දීම ද වේ.

එසේම ධීවර කර්මාන්තය සංවර්ධනය උදෙසා නව තාක්ෂණය හඳුන්වාදීම ද, පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ද, අපනයන හා දේශීය පරිභෝජනය සඳහා වන මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අදාල වැඩිදියුණු කිරීම ද, ධීවර කුටුම්භයන්හි සමාජ හා ආර්ථික තත්ත්වය නංවා ගැනීම සඳහා ධීවරයින් සහ ධීවර කාන්තාවන් සඳහා දිරිගැන්වීම් සැපයීමද ප්‍රමුඛ කාර්යයන් බවට පත්ව ඇත.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

### 1.2.1. දැක්ම

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම.

### 1.2.2. මෙහෙවර

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමණාකරණය කිරීම.

### 1.2.3. අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමණාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය.
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම.
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම.
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
- අන්තර් ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදුකරනබවට සහතික වීම.
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම.
- මහමුහුදේ ධීවර කටයුතු වල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ග ගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින් හට ප්‍රශස්ත සේවාවක් ලබාදීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ග ගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාල දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකිවීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම. උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත් නිකුත් කිරීම.
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත් භාවය වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය.
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම.
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම.
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම.
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- ධීවර කර්මාන්තයට අදාල දත්ත රැස් කිරීම.
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයන සඳහා ස්වස්ථා සහතික නිකුත් කිරීම.
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම.
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවිකිරීම.
- ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබාදීම.
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම
- දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම.
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබාදෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම.
- අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාල ආයතන දැනුවත් කිරීම.
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.
- ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවලදී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කරදීම.
- අන්තර් ජාතික මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ධීවර කාර්මික රක්ෂණය හා විශ්‍රම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ධීවර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය.
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

## 1.4. සංවිධාන සටහන

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයකු මගින් පාලනය වේ. එම කටයුතු වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු ද පත්කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීමේ පහසුව සලකා ප්‍රධාන කාර්යාලයේ කටයුතු අංශ 09 කට බෙදා වෙන්කර තිබේ.

එනම්,

1. ධීවර කළමනාකරණ අංශය
2. ධීවර සංවර්ධන අංශය
3. ධීවර නිෂ්පාදන තත්ත්ව පාලන අංශය
4. ධීවර මෙහෙයුම් අංශය
5. විමර්ශන හා පුහුණු අංශය
6. තොරතුරු තාක්ෂණ අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශවල කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂවරුන් අටදෙනෙකු හා ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් ඉටුවේ.

දිවයිනේ මුහුදුබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් ධීවර කාර්යාල 15 ක් පිහිටුවා තිබෙන අතර එක් එක් දිස්ත්‍රික්කයේ කටයුතු එම දිස්ත්‍රික් ධීවර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම යටතේ ඉටුවේ.

දිස්ත්‍රික්ක තුළ මුහුදු බඩ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර පරීක්ෂක කොට්ඨාශ 148 ක් පිහිටුවා ඇත. මෙම සෑම ධීවර පරීක්ෂක කොට්ඨාශයකම ධීවර පරීක්ෂක කාර්යාලය බැගින් ස්ථාපිත කර ඇත. ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, සංවර්ධන නිළධාරී සහ ධීවර නිලධාරී යන නිළධාරීන් විසින් මෙම ධීවර පරීක්ෂක කොට්ඨාශ තුළ සියලු ධීවර කටයුතු ක්‍රියාත්මක කෙරේ.

එසේම ධීවර වරායන් ආශ්‍රිතව ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 20 ක් පිහිටුවා ඇති අතර ගුවන් විදුලි නිලධාරීන් දිවා රාත්‍රී මෙම මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇත. මෙම ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන මගින් මහමුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සම්බන්ධතාවය පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. එමගින් යාත්‍රා සඳහා කාලගුණ වාර්තා හා හදිසි පුර්ව අනතුරු ඇගවීම් ද දෛනිකව ලබාදෙන අතර යාත්‍රා හිමියන්ගේ පණිවුඩ ලබාදීම හා ධීවර කාර්මිකයින්ගේ පණිවුඩ ලබා ගැනීම් ද සිදු කරනු ලබයි. තවද ධීවර යාත්‍රාවලින් ලැබෙන හදිසි ආපදා පණිවුඩ සඳහා එම අවස්ථාවේ සිට එම කාර්යය අවසන්වන තෙක් අවශ්‍ය සියළු කටයුතු සිදුකරනු ලබයි. මෙම සියළු කාර්යයන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි සෝදිසි මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ඊට අමතරව දිස්ත්‍රික්ක 07 ක පිහිටි ධීවර වරායන් 15 ක වරාය කාර්යාල පිහිටුවා ඇති අතර ධීවර පරීක්ෂක සහ සංවර්ධන නිළධාරී යන නිළධාරීන් විසින් දිවා රාත්‍රී වරායෙන් පිටත්වන යාත්‍රා පරීක්ෂා කිරීම, පිටත්වීම ලියාපදිංචිය හා අවසර ලබාදීම, වරායට පැමිණෙන ධීවර යාත්‍රා ගමන් වාරයට අදාල ලොග් සටහන ලබා ගැනීම, ඒ අනුව මත්ස්‍ය අස්වැන්න පරීක්ෂාව, අපනයනයට නියමිත මත්ස්‍ය තොග සඳහා වාර්තා සකස් කර ගැනුම්කරුවන්ට ලබාදීම, නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු සිදුවී තිබේ නම් ප්‍රකාශ ලබා ගැනීම හා ලොග් සටහන් හා ලබාගත් ප්‍රකාශ ෆැක්ස් හා ඊමේල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබාදීම සහ විකල්ප නිරීක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**2.1. විශේෂ ජයග්‍රහණ,**

1. 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ විධි විධාන වලට අනනුකූලවීම සම්බන්ධව 2019 වසර තුල නඩු 132 ක් පවරා තිබීම.
2. යාත්‍රා නිරීක්ෂණ උපකරණ සම්බන්ධ පවත්නා නීතිවලට අනනුකූලවීම සම්බන්ධව 2019 වසර තුල

   යාත්‍රා පිටත්වීම අවලංගු කිරීම (Departure cancel). 23

   නීතිමය පියවර ගැනීම සඳහා යොමු කිරීම 39

3. 2019 වසර තුල විමර්ශන

| කළ වරද | විමර්ශන ආරම්භ කරන ලද ප්‍රමාණය | විමර්ශන අවසන් කරන ලද ප්‍රමාණය | විමර්ශන අවසන් නොවූ ප්‍රමාණය | උසාවියේ නඩු පැවරීම් | පරිපාලන මණ්ඩලයට/ සමථකරණයට යොමුකළ ප්‍රමාණය | දඩ ගෙවීම (රු.) |
|---|---|---|---|---|---|---|
| වෙනත් රටක ධීවර මෙහෙයුම් සිදුකිරීම | **14** | **14** | **-** | **14** | **02** | **-** |
| ලොග් නඩු සහ දඩ ගැසීම් | **08** | **07** | **01** | **01** | **07** | **35,000/=** |
| කස මෝරුන් ඇල්ලීම | **01** | **01** | **-** | **01** | **-** | **-** |
| බලපත්‍ර රහිත ධීවර මෙහෙයුම් | **21** | **21** | **-** | **21** | **-** | **-** |
| බලපත්‍රයක් රහිතව මුහුදු කුඩැල්ලන් අපනයනය කිරීම | **04** | **04** | **-** | **04** | **-** | **70,000/=** |
| හෝටල් හා ආපන ශාලාවල රහිතව කටු පොකිරිස්සන් සන්තකයේ තබාගැනීම. | **05** | **05** | **-** | **05** | **-** | **40,000/=** |
| තහනම් කාල සීමාවේ කටු පොකිරිස්සන් සන්තකයේ තබාගැනීම. | **04** | **04** | **-** | **04** | **-** | **45,000/=** |

4. ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ සාදන ලද නියෝග 07 ක් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.
   - 2016 ශ්‍රී ලංකා ජල තීරය තුල මසුන් සහ ජලජ සම්පත් ආරක්ෂා කිරීමේ නියෝග
   - 2017 අංක I දරන ධීවර මෙහෙයුම් වලදී උල් කරන ලද කුරු භාවිතා කිරීම තහනම් කිරීමේ නියෝග
   - 2017 තඹුවා මත්ස්‍ය විශේෂය ඇල්ලීම තහනම් කිරීමේ නියෝග
   - 2015 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට එරෙහි වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝග (සංශෝධන)
   - 1984 මැදැල් නියෝග මාලාව (සංශෝධන)
   - විදේශීය ධජය සහිත ධීවර බෝට්ටු වල ධීවර කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන් සඳහා වන අවම ප්‍රමිති පිළිබඳ නියෝග මාලාව (සංශෝධන)
   - 1996 ධීවර මෙහෙයුම් නියෝග මාලාව ( සංශෝධන )

5. 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියමුවන් (දේශීය ධීවර බෝට්ටු වල) සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීමේ නියෝග අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇත.

**6.** ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ සාදන ලද නියෝග 05 ක් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම (නීති විරෝධී ක්‍රියාවන් නියාමනය කිරීම සඳහා)
- 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම (බලය ලත් නිලධරයන්ගේ බලතල වලට බාධා කිරීම )
- විනෝදය පිණිස මසුන් මැරීමේ ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීමේ නියෝග
- මසුන් පරිහරණය සහ බෙදා හැරීම විධිමත් කිරීමේ නියෝග
- 2019 ධීවර (ගාස්තු පැනවීමේ ) නියෝග

**7.** අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

| | |
|---|---|
| • විසිතුරු මසුන් අපනයනය. | 49 |
| • පොකිරිස්සන් අපනයනය. | 93 |
| • හක් බෙල්ලන් අපනයන . | 29 |
| • මුහුදු කූඩැල්ලන් අපනයනය. | 130 |
| • කෘත්‍රිම උපස්තර මත වගාකරන ලද මුහුදු ජීවීන් අපනයනය. | 05 |
| • විදේශීය ධීවර යාත්‍රා මගින් වරාය සේවා හා පහසුකම් ලබා ගැනීම. | 74 |
| • මුහුදු ආහාර අපනයනය සඳහා ස්වස්ථතා සහතික | 51,791 |
| • මසුන් ඇල්ලීමේ සහතික | 23,186 |
| • මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය | 44 |
| • මත්ස්‍ය ඇසුරුම් මධ්‍යස්ථාන ලියාපදිංචිය | 15 |

**8.** ධිවර කාර්මිකයින්/ධිවර යාත්‍රාවල සුරක්ෂිතතාවය තහවුරුකිරීම.

| | |
|---|---|
| • රක්ෂණය කරන ලද සමස්ථ ධිවර යාත්‍රා සංඛ්‍යාව | 27,294 |
| • රක්ෂණය කරන ලද සමස්ථ ධිවර කාර්මිකයින් සංඛ්‍යාව | 50,777 |
| • ධිවර විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ සංඛ්‍යාව | 1,963 |
| • මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම් සංඛ්‍යාව | 24,014 |

- හදිසි ආපදා රක්ෂණය -

මෙම වැඩසටහන ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික රක්ෂණ භාර අරමුදල සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා ප්‍රතිලාභියාගෙන් අය කිරීමක් සිදු නොකරයි. මේ යටතේ ධිවර කටයුතුවල යෙදී සිටියදී සිදුවන හදිසි ආපදාවක් හේතුවෙන් මිය යන ධිවර කාර්මිකයෙකු සඳහා ඔහුගේ යැපෙන්නන්ට රුපියල් මිලියනයක රක්ෂණාවරණයක් ලබා දෙනු ලබයි.

2019 වසර තුල ප්‍රතිලාභී පවුල් 8 ක් සඳහා රක්ෂණ වන්දි ලබා දී ඇත.

- දිවි සයුර රක්ෂණය -

ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සෙලින්කෝ රක්ෂණ සමාගම සමග එක්ව ක්‍රියාත්මක කරන ලද අතර සාමාජිකයෙකු වර්ෂයකට ගෙවිය යුතු රක්ෂණ වාරික මුදල රු 1036.00 කි. මෙමගින් හදිසි අනතුරකදී මරණයට පත් වීමකදී හෝ සදාකාලික පූර්ණ දුබලතාවයට පත් වීමකදී රු 1,000,000/-ක වන්දි මුදලක් ද ස්වාභාවික මරණයකදී රු 200,000/-ක වන්දි මුදලක් ද ලබා දේ.

**2019** වසරේදී

| | | |
|---|---|---|
| හදිසි අනතුරු මරණ 2 ක් සඳහා | රු. 2 000 000.00, | |
| ස්වාභාවික මරණ 18 ක් සඳහා | රු 3 600 000.00 | |
| වෙනත් | රු. 3 409 500.00 | ප්‍රතිලාභ ලබා දී ඇත. |

- ධීවර සුරැකුම් රක්ෂණය -

2019 වසරේදී ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණයෙන් ආලියාන්ස් රක්ෂණ සමාගම සමඟ ආරම්භ කරන ලද අතර එහි වාර්ෂික වාරික මුදල රු.1348.00 ක් වේ. එමගින් ධීවර කාර්මිකයින්ගේ හදිසි අනතුරු මරණයකදි පවුලේ සමාජිකයින් සඳහා රු.මිලියනයක් සහ ස්වාභාවික මරණයකදි රු.250,000.00 රක්ෂණාවරණ මුදලක් ලබා දේ.

දැනට එම රක්ෂණාවරණය සඳහා ප්‍රතිලාභීන් බඳවා ගැනීම ආරම්භ කර ඇත.

**9.** දියවර දිරිය ණය යෝජනා ක්‍රමය -

නව තාක්ෂණය හඳුන්වා දීම තුලින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමත් ගුණාත්මක තත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනීමත් අරමුණු කර ගනිමින්, ධීවර යාත්‍රා වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ලංකා බැංකුව සමග එක්ව දියවර දිරිය අඩු පොලි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් මිලියන 15ක උපරිමයකට යටත්ව ණය ලබා දෙන අතර පොලි අනුපාත පහත පරිදි වේ.

- ණය මුදල රුපියල් මිලියන 2ට අඩු නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 5%
- ණය මුදල රුපියල් මිලියන 2ට වැඩි නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 7%
- එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය මගින් 4%ක පොලි සහනාධාරයක් මෙම යෝජනා ක්‍රමයට ලබා දේ.
- ධීවර යාත්‍රාංගන වැඩි දියුණු කිරීම්, අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය, නව තාක්ෂණය වැඩි දියුණු කිරීම් (RSW, CSW), මරුවැල් පන්න හා වින්ච් සවි කිරීම් සඳහා ණය ලබා දීමේදි ප්‍රමුඛතාවය ලබා දේ.
- ප්‍රතිලාභීන් 609 ක් සඳහා ණය ලබා දි ඇති අතර ලබා දි ඇති මුලු ණය ප්‍රමාණය රුපියල් මිලියන 1,553.85 කි.

**10.** මත්ස්‍ය ඒකරාශී කාරක ඇටවුම් සකස් කිරීමේ වැඩසටහන.

- භාවිතයෙන් ඉවත්කළ බහුදින ධීවර යාත්‍රා සකස් කර මුහුදු පතුලේ හඳුනාගත් ස්ථානයන්හි ස්ථානගත කිරීමෙන්, පසුකාලිනව ස්වාභාවිකවම නව පරිසර පද්ධතියක් ඒ ආශ්‍රිතව නිර්මාණය වන අතර මත්ස්‍ය අභිජනන ස්ථානයක් ලෙස එය වර්ධනය වේ. එමගින් මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශයට පත් කොරල්පර වැනි පරිසර පද්ධති වෙනුවට විකල්ප පරිසර පද්ධතින් ඇතිවිමෙන් මත්ස්‍ය අභිජනන ස්ථාන වැඩිවිම තුලින් මත්ස්‍ය ගහණය වැඩිකිරීම අපේක්ෂා කෙරේ.
- භාවිතයෙන් ඉවත්කළ බහුදින ධීවර යාත්‍රා ඉවත් කිරීමට හැකි විම මගින් වරාය පරිශ්‍රයේ ඉඩ පහසුකම් ලබා ගැනීම හා ඩෙංගු ව්‍යාපෘතිය වැනි පාරිසරික ගැටළු අවම කර ගැනීමට හැකි විම.
- නොදිරන අපද්‍රව්‍යක් වශයෙන් පවතින භාවිතයෙන් ඉවත් කරන ලද පයිබර්ග්ලාස් ධීවර යාත්‍රා පරිසරයට හානි නොවන ලෙස ඉවත් කිරීම.
- මෙම වැඩසටහන යටතේ දැනට ඉවත් කල යුතු ධීවර යාත්‍රා හඳුනා ගෙන ඇති අතර ධීවර යාත්‍රා ගිල්වීමට සුදුසු ස්ථාන සහතික කර ගනිමින් පවති. අදාල ව්‍යාපෘතිය සඳහා සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරියේ මූලික අනුමැතිය ලබා ගෙන ඇත.

## 11. කලපු සංවර්ධනය

- කලපු සිමා සලකුණු කිරීම

  මේ සඳහා රුපියල් මිලියන 25 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇති අතර ප්‍රමුඛතාව අනුව තෝරා ගත් කලපු 8 ක මැනිම් කටයුතු සිදු කර මායිම් සලකුණු කිරීමට අවශ්‍ය වන මායිම් කණු 14,748 ක් නිෂ්පාදනය කර අවසන් කර ඇත. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් මායිම් කණු සිටුවීම සිදුකරමින් පවතින අතර රැකව කලපුවේ මායිම් කණු 645 ක් සිටුවා අවසන් කර ඇත.

- ජීවනෝපාය සංවර්ධනය ව්‍යාපෘති

  මොදා මත්ස්‍ය ව්‍යාපෘතිය යටතේ පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 54 දෙනෙකු සඳහා මොදා මත්ස්‍ය පැටවුන් 41,000 ක් ද, මීගමුව ධීවර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 39 දෙනෙකු සඳහා මොදා මත්ස්‍ය පැටවුන් 39,000 ක් හා මඩකලපුව ධීවර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 29 ක් සඳහා මොදා මත්ස්‍ය පැටවුන් 29,000ක් ලෙස ලබාදෙන ලදී.

- යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

  මේ යටතේ කලපු ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ සනිපාරක්ෂක පහසුකම් වැඩියුණු කිරීම ප්‍රවේශ මාර්ග සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය ආදි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක අතර ඒ සඳහා රුපියල් මිලියන 130 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. ඒ අනුව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 67 කට අදාලව රුපියල් මිලියන 164.77 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇත.

- තොටුපල සංවර්ධනය

  කලපුවල තෝරා ගත් තොටුපල ආශ්‍රිත පිරිසිදු කිරීම හා ගැඹුරු කිරීම් සඳහා රුපියල් මිලියන 11.25 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දි ඇත.

## 12. දියවර පියස නිවාස හා සනිපාරක්ෂක වැඩසටහන

- ධීවර ගම්මානවල විධිමත් නිවාස හා සනිපාරක්ෂක පහසුකම් නොමැති ධීවර ජනතාව සඳහා නිවාස හා සනිපාරක්ෂක පහසුකම් ලබාදීම අරමුණු කරගනිමින් දියවර පියස නිවාස හා සනිපාරක්ෂක වැඩසටහන ආරම්භ කරන ලද අතර 2019 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 57 කි.

- මේ යටතේ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිලාභීන් 361 ක් සඳහා රුපියල් ලක්ෂයක් බැගින් ලබා දි ඇත.

- සනිපාරක්ෂක පහසුකම් නොමැති ධීවර පවුල් සඳහා වැසිකිලියක් ඉදි කිරීමට රුපියල් 30,000/- ක් ද අලුත්වැඩියාව සඳහා රු 15,000/- ක් ද ලබා දෙන අතර ප්‍රතිලාභීන් 158 ක් සඳහා පූර්ණ සනිපාරක්ෂක පහසුකම්ද ප්‍රතිලාභීන් 94ක් සඳහා සනිපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහාද ආධාර ලබා දි ඇත.

**13. විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම.**

| අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|
| **204** | **205** | **37** | **32** |

**14. දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීම.**

| මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව | අත්හැර දමන ලද යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|
| 712 | 116 | 06 |

**15. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු සත්‍යාපනය කිරීම**

| | | |
|---|---|---|
| 1. | අවසන් වූ මහ මුහුදේ ධීවර මෙහෙයුම් ගණන | 12,068 |
| 2. | මහ මුහුදේ මෙහෙයුම් වලට අදාලව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන | 11,754 |
| 3. | මෙහෙයුම් වලට අදාලව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන | 4,235 |
| 4. | ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන | 44,194 |

**16. තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීමේ ප්‍රගතිය**

| | | |
|---|---|---|
| 1. | ධීවර කාර්මිකයින් ලියාපදිංචි කිරීම. | 18,000 |
| 2. | මාර්ග ගත ක්‍රමයට මහ මුහුදේ මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම. | 1,200 |
| 3. | e-log ක්‍රමය මගින් ආවරනය කරන ලද ගමන්වාර සංඛ්‍යාව | 5,000 |
| 4. | IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා යාත්‍රා ජායාරූප වාර්තා ගණන | 500 |

# 03. පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

### 2019.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| අයවැය 2019 | | සටහන | තත්‍ය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | | |
| - | **ආදායම් ලැබීම්** | | | | | |
| - | ආදායම් බදු | **1** | - | - | | |
| 31,880,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | 58,348,336 | 32,497,474 | | **ඒසීඒ-1** |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | - | - | | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | | | | |
| 31,880,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **58,348,336** | **32,497,474** | | |
| | | | | | | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 768,922,000 | 419,977,443 | | |
| - | තැන්පතු | | 53,014,606 | 185,688,293 | | |
| - | අත්තිකාරම් ගිණුම් | | 30,781,674 | 40,442,885 | | |
| - | වෙනත් ලැබීම් | | 29,287,324 | 176,826,426 | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **882,005,604** | **822,935,047** | | |
| | | | | | | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **940,353,940** | **855,432,521** | | |
| | | | | | | |
| | **අඩුකළා : වියදම්** | | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | | |
| 378,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 380,029,516 | 349,428,827 | | |
| 77,100,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 81,288,413 | 87,383,860 | | |
| 60,800,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 101,344,368 | 40,361,749 | | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | | |
| 500,000 | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 7,951 | 178,445 | | |
| **516,400,000.00** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **562,670,249** | **477,352,881** | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | | |
| 17,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 21,415,895 | 21,902,066 | | |
| 40,400,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 119,412,909 | 53,542,928 | | |
| 4,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 1,567,445 | 3,588,384 | | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | | |
| 2,000,000 | හැකියා වර්ධනය | **14** | 1,491,554 | 2,837,147 | | |
| 75,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 43,975,530 | 78,606,067 | | |
| **138,400,000.00** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **187,863,333** | **160,476,592** | | |
| | | | | | | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **113,151,390** | **204,807,029** | | |
| | **තැන්පතු ගෙවීම්** | | 78,049,203 | 167,450,968 | | |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 35,102,186 | 37,356,061 | | |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | 863,684,971 | 842,636,502 | | |
| | | | | | | |
| - | **2019**දෙසැම්බර් **31** දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | **76,668,968** | **12,796,019** | | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | | තත්‍ය | | |
|---|---|---|---|---|
| | සටහන | 2019 | | 2018 |
| | | රු. | | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 759,723,389 | | 639,936,960 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 89,838,380 | | 94,036,792 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 2,278,945 | | - |
| **මුළු වත්කම්** | | **851,840,714** | | **733,973,752** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | | |
| ශුද්ධ වත්කම් | | 41,594,485 | | 18,525,628 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 759,723,389 | | 639,936,960 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | | 8,518,925 |
| **ජංගම වගකීම්** | | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 48,243,895 | | 66,992,239 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 2,278,945 | | - |
| **මුළු වගකීම්** | | **851,840,714** | | **733,973,752** |

පිටු අංක 01 සිට 33 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 34 සිට 46 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ..... | ..... | ..... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ |
| නම : | නම : | අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්) |
| තනතුර : | තනතුර : | නම : |
| දිනය : 26/02/2020 | දිනය : 26/02/2020 | දිනය : 26/02/2020 |

ආර්.එම්.අයි. රත්නායක
ලේකම්
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
02 වන මහළ, නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10

ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ඒ. ඒ. ඩී. ජේ. අයි. සූරියආරච්චි
අධ්‍යක්ෂ (මුදල්)
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
කොළඹ 10.

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2019** | **2018** |
| | **රු.** | **රු.** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 58,348,336 | 32,497,474 |
| ලාභ | | - |
| ආදායම් නොවන ලැබීම් | | 603,511,161 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම | 8,010,005 | |
| අග්‍රිම ලැබීම් | 768,922,000 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **835,280,341** | **636,008,635** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 559,670,249 | 451,428,924 |
| සහනාධාර සහ මාරුකිරීම් | | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 63,409,168 | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **623,079,417** | **451,428,924** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | 212,200,924 | 184,579,711 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | | - |
| ලාභාංශ | | - |
| භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - |
| උපණය අයකර ගැනීම් | | - |
| අත්තිකාරම් අය කර ගැනීම | 25,090,488 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **25,090,488** | **-** |

| | | |
|---|---|---|
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 159,769,159 | 227,561,704 |
| අත්තිකාරම් ගෙවීම් | 29,956,343 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **189,725,502** | **227,561,704** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | (164,635,014) | (227,561,704) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **47,565,910** | **(42,981,993)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | | - |
| විදේශීය ණය ගැනීම් | | - |
| ප්‍රදානයන් ලැබීම් | | - |
| තැන්පතු ලැබීම් | 25,682,110 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **25,682,110** | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - |
| තැන්පතු ගෙවීම් | 70,969,075 | 42,981,993 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **70,969,075** | **42,981,993** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | (45,286,965) | (42,981,993) |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | 2,278,945 | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | 2,278,945 | - |

**3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්**

වාර්තා කිරීමේ පදනම

**1) වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2) මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3) ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.6. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය**

| ආදායම් ක්ෂේත්‍රය | ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රු.) | අවසන් ඇස්තමේන්තුව (රු.) | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 10.03.07.06 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාල බලපත්‍ර ගාස්තු | 31,880,000 | 47,200,000 | 58,343,336 | 123.61 |

## 3.7. වෙන් කරනලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරන ලද ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 516.4 | 569.79 | 562.60 | **98.7** |
| ප්‍රාග්ධන | 138 | 566.63 | 187.86 | **33.2** |
| | **654.8** | **1,136.42** | **750.46** | **66.0** |

## 3.8 මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 118-2-14-2-2202 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | දෙපා.ජාලගත මෘදුකාංගය නිර්මාණය | 9 | 9 | 4.29 | 47.67 |
| 118-2-14-5-2506 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | මාතර උම්බලකඩ නිෂ්පාදනය | 2.03 | 10.1 | 2.3 | 22.6 |
| 118-2-14-64-2509 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | මෝදා කූඩු වගාව, ඉස්සන් පැටවුන් මුදාහැරීම, කළපු සීමා සලකුණු කිරීම, කරවල නිෂ්පාදනය (පුත්තලම), හලාවත මූන්දලම මායිම් ගල් | 26.06 | 86.59 | 68.7 | 79.3 |

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට මූල්‍ය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
